සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

40/S/I,II

# පෙරහුරු පරීක්ෂණය - 2024
## 11 ශ්‍රේණිය

**සංගීතය (පෙරදිග) I, II** | **කාලය පැය තුනයි**

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න**

## සංගීතය (පෙරදිග) I

**උපදෙස්**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. සංගීත විෂය හදාරන ආධුනිකයකු ආරම්භයේදී ම පුහුණු විය යුතු සංගීතාංගයක් වන්නේ

   (1) රාග ආලාප ය. (2) ඛ්‍යාල් ගීත ය. (3) ස්වර අභ්‍යාස ය. (4) තානාලංකාර ය.

2. නි ධ නිරිස , පම ගරිස යන ස්වර සංගතිය අයත්වන රාගය කුමක් ද ?

   (1) කාෆි. (2) භෛරවී. (3) බිලාවල්. (4) යමන්.

3. ස රි ම ප නි යන ස්වර අනුවාදී ස්වර ලෙස යෙදෙන රාගය කුමක් ද?

   (1). බිලාවල්. (2) භූපාලි. (3) කාෆි (4) යමන්.

4. ගානසමයට අනුව දිවා ප්‍රථම ප්‍රහරයේදී සහ රාත්‍රී ප්‍රථම ප්‍රහරයේදී ගැයීමට සුදුසු නිර්දේශිත රාග දෙක පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.

   (1). යමන් සහ භූපාලි. (2) බිලාවල් සහ භූපාලි.

   (3) බිලාවල් සහ භෛරවී. (4) භූපාලි සහ බිලාවල්.

5. කාෆි රාගයෙහි රාග ජාතිය ඇතුළත් පිළිතුර කුමක් ද?

   (1). ෂාඩව - ෂාඩව. (2) ඖඩව - ෂාඩව.

   (3) ෂාඩව - සම්පූර්ණ .(4) සම්පූර්ණ - සම්පූර්ණ

6. සගරි, රිමග, වශයෙන් පිළිවෙළින් ගොඩනැගෙන ශුද්ධ ස්වර අභ්‍යාසයෙහි තුන්වැනියට සහ පස්වෙනියට යෙදෙන ස්වර සමූහය තෝරන්න.

   (1). ගපම, පනිධ (2) ගපම, ධසනි (3. මපධ, පනිධ (4) මධප, පනිධ

7. සධ පධ මප ගම | ගම පම ගරි ස– වශයෙන් යෙදෙන තානාලංකාරය අදාළ වන රාගය වන්නේ,

(1) භෛරවී ය. (2) කාෆි ය. (3) යමන් ය. (4) භූපාලි ය.

8. ග ධ සහ ධ ග යන ස්වර, වාදී සංවාදී ලෙස පිළිවෙලින් යෙදෙන රාග යුගලය තෝරන්න.

(1). යමන් සහ කාෆි. (2) බිලාවල් සහ භෛරවී.

(3) භූපාලි සහ බිලාවල්. (4) භූපාලි සහ යමන්.

9. භූපාලි රාගය සම්බන්ධයෙන් සඳහන් කර ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1). කල්‍යාණ මේලගත සම්පූර්ණ ජාති රාගයකි.

(2). ම, නි වර්ජිත වන කල්‍යාණ මේලගත රාගයකි.

(3) බිලාවල් මේලගත ඖඩව ජාති රාගයකි.

(4) ම, නි වර්ජිත ඖඩව - සම්පූර්ණ ජාති රාගයකි.

10. සධ සරි ගප ධස් ස්ස් ධප ගරි ගප ගප ධස් රිස් ධප ගරි ස– මෙම තානාලංකාරය නිර්දේශිත හින්දුස්ථානී තාලයක එක් ආවර්ථයකට අනුව රචනාවී ඇත. එම තානාලංකාරයට අදාළ රාගය සහ තාලය ඇතුළත් වරණය තෝරන්න.

(1). බිලාවල් රාගය සහ ත්‍රී තාලය. (2) බිලාවල් රාගය සහ කෙහෙර්වා තාලය.

(3) භූපාලි රාගය සහ ජප් තාලය. (4) භූපාලි රාගය සහ දීප්චන්දි තාලය.

11. “කෙහෙර්වා තාලය” තබ්ලාවෙන් වාදනය කිරීමේ දී, එහි අවනද්ධාක්ෂර උත්පාදනය කරගන්නා ආකාරය නිවැරදිව සඳහන් කර ඇති පිළිතුර තෝරන්න.

(1). දහිනාවෙන් අක්ෂර 04, බායාවෙන් අක්ෂර 03, කොටස් දෙකම එකවර වාදනයෙන් අක්ෂර 01

(2). දහිනාවෙන් අක්ෂර 04, බායාවෙන් අක්ෂර 02, කොටස් දෙකම එකවර වාදනයෙන් අක්ෂර 02

(3) දහිනාවෙන් අක්ෂර 03, බායාවෙන් අක්ෂර 03, කොටස් දෙකම එකවර වාදනයෙන් අක්ෂර 02

(4) දහිනාවෙන් අක්ෂර 02, බායාවෙන් අක්ෂර 04, කොටස් දෙකම එකවර වාදනයෙන් අක්ෂර 02

12. “ ස ත්/වෙ ත් ම/හ ත්/අ ද ර ” යන ගීත පාදය ගායනයේ දී වාදනය කළ යුතු බෙර පදය අයත් තිත කුමක් ද?

(1) සුළු තනිතිත (2) මැදුම් මහ දෙතිත (3) මහ තනි තිත (4) සුළු මැදුම් දෙතිත

13. “ X ” සහ “ O ” යන තාල සංඥා දෙක පමණක් යෙදෙන නිර්දේශිත හින්දුස්ථානී තාලය කුමක් ද?

(1) දාදරා තාලය (2) ජප් තාලය (3) ත්‍රී තාලය (4) ලාවනී තාලය

14. තත්, අවනද්ධ සහ සුෂිර යන සංගීත භාණ්ඩ වර්ග තුන සඳහා ප්‍රසිද්ධ ඉන්දියානු සංගීතඥයන් තිදෙනෙකුගේ නම් පිළිවෙලින් සඳහන් කර ඇති පිළිතුර තෝරන්න.

(1) රවී ශංකර්, හරිප්‍රසාද් චෞරසියා , ශිවකුමාර් ෂර්මා

(2) ශකීර් හුසේන් , රවී ශංකර්, හරිප්‍රසාද් චෞරසියා

(3) ශිවකුමාර් ෂර්මා, ශකීර් හුසේන් , හරිප්‍රසාද් චෞරසියා

(4) ශිවකුමාර් ෂර්මා, රවී ශංකර්, ශකීර් හුසේන්

15. සමුද්‍රඝෝෂ වෘත්තයට අනුව ගායනය කළ හැකි ගීත පාදයක් වන්නේ මින් කුමක් ද?

(1) පුන් මදාරා මල් දමින් යුත් දිගු සුනිල් වරලස ගොතා

(2) පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට

(3) මන් මත් කරවන දන මුළු දෙරණා

(4) රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පහත දී ඇති  සංගීත භාණ්ඩවල රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



A B C D E

16. මිශ්‍රාබයෙන් සහ පික් (Pic) එකෙන් වයනු ලබන සංගීත භාණ්ඩ යුගලයට අයත් ඉංග්‍රීසි අක්ෂර පිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.

(1) B සහ C (2) C සහ E (3) C සහ B (4) B සහ A

17. ස්වර පිහිටීම සමාන වන භාණ්ඩ යුගලයට අයත් ඉංග්‍රීසි අක්ෂර වන්නේ,

(1) C සහ E ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) A සහ E ය.

18. සට්ටා, ලවය, චාන්ටිය යන කොටස් පිහිටා ඇති  සංගීත භාණ්ඩයට අයත් ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද?

(1) A (2) D (3) B (4) C

19. තත් සංඛ්‍යාව, හතරක් සහ හයක් ලෙස පිහිටා ඇති සංගීත භාණ්ඩ දෙකට අයත් ඉංග්‍රීසි අක්ෂර දෙක පිළිවෙලින් සඳහන් කර ඇති වරණය තෝරන්න.

(1) B සහ E (2) C සහ E (3) A සහ C (4) A සහ B

20. අළුවකින් (Bow) වයනු ලබන සංගීත භාණ්ඩ යුගලයට අයත් ඉංග්‍රීසි අක්ෂර වන්නේ ,

(1) A සහ E ය. (2) A සහ C ය. (3) A සහ B ය. (4) C සහ E ය.

- අංක 21 සිට 25 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.

A - වරමාතී සුභ චරිතේ

B - රටලිම් ඇරලා පටි ගෙන්නාලා

C - දඩි බිඩි ගගා කරනා වැඩ රට වටියේ

D - මෝරා බීජයෙනා

E - සේවිත පාද සරෝරුහ සන්ජිත

F - බුද්ධං සරණේ සිරස දරාගෙන

21. ජන ගී වර්ගීකරණයේ එන ගැමි ගී සහ සේ ගී වර්ග වලට අයත් ගීත දෙකකට අදාළ ඉංග්‍රීසි අක්ෂර පිළිවෙළින් ඇතුළත් පිළිතුර වන්නේ,.

(1) A සහ B ය. (2) C සහ E ය. (3) E සහ F ය. (4) B සහ C ය.

22. මහනුවර යුගයේදී ප්‍රචලිත වූ ගීත විශේෂයන්ට අදාළ ගීත පාදවල ඉංග්‍රීසි අක්ෂර ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A, B (2) D, F (3) A, D (4) B, D

23. ආඝාතාත්මකව සහ අනාඝාතාත්මකව ගැයෙන ගීත විශේෂයන් දෙකකට අයත් ඉංග්‍රීසි අක්ෂර ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) B සහ C (2) B සහ D (3) C සහ E (4) D සහ F

24. කෙළි ගී සහ ඇඳහිලිගී වල ගීත පාද දෙකකට අයත් ඉංග්‍රීසි අක්ෂර පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) C සහ F (2) B සහ E (3) A සහ F (4) B සහ F

25. " E " අක්ෂරයෙන් දක්වා ඇති ගීත පාදයෙහි සඳැස්මත් ගණන සහ ගීමත් ගණන නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) සඳැස්මත් 16, ගීමත් 28 (2) සඳැස්මත් 24, ගීමත් 16

(3) සඳැස්මත් 18, ගීමත් 32 (4) සඳැස්මත් 16, ගීමත් 20

26. දකුණු ඉන්දියානු කර්ණාටක සංගීත පද්ධතිය සහ හින්දුස්ථානී සංගීත පද්ධතිය ඇසුරින් සංගීතය නිර්මාණය වූ රංග ශෛලීන් දෙකක් පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ.

(1) නූර්ති සහ නාඩගම් ය. (2) වන්නම් සහ ප්‍රශස්ති ය.

(3) නාඩගම් සහ නූර්ති ය. (4) නාඩගම් සහ කෝලම් ය.

27. නූර්ති සහ නාඩගම් රංග සම්ප්‍රදායන් සඳහා සංගීතය සැපයූ සංගීතඥයින් දෙදෙනෙකුගේ නම්, පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) විශ්වනාත් ලව්ජි සහ අබ්දුල් සතාර් (2) විශ්වනාත් ලව්ජි සහ අලගනායිදු

(3) ගණිතාලංකාර සහ ජටා ශංකර් (4) අලගනායිදු සහ ජටා ශංකර්

28. " ඕලු නෙළුම් නෙරිය රඟාලා " යන ගීතය ඇතුළත් චිත්‍රපටය කුමක් ද?

(1) රොඩී කෙල්ල. (2) මාතලන්. (3) සැඩසුළං. (4) රේඛාව.

29. සංගීත භාණ්ඩවල හඬ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීමට හේතු වන නාදයේ ගුණය හඳුන්වනු ලබන්නේ,

(1) ධ්වනිගුණය වශයෙනි. (2) තාරතාවය වශයෙනි.

(3) විපුලතාවය වශයෙනි. (4) රූපභේදය වශයෙනි.

30. මව් පිය දෙදෙනාගේම ගුණ ඇතුලත් ගීතයක් සහ එහි ගායන ශිල්පියාගේ නම ඇතුළත් පිළිතුර තෝරන්න .

(1) ගමට කලින් හිරු මුළුතැන්ගෙට වඩනා - සුනිල් දයානන්ද කෝනාර

(2) නැති බැරි මොහොතක පිහිටට එන්නේ - රෝහණ වීරසිංහ

(3) අන්දරයායේ වැව් තාවුල්ලේ - කරුණාරත්න දිවුල්ගනේ

(4) ආරදයේ උල්පත වූ - වික්ටර් රත්නායක

31. ග්‍රැමෆෝන් ගීතයක් ,කපිරිඤ්ඤා ගී තනු ඇසුරෙන් නිර්මාණය කළ ගීතයක් සහ ජනගී ආශ්‍රිත සරල ගීතයක් යන ගීත තුන පිළිවෙලින් ඇතුළත් පිළිතුර තෝරන්න.


(1) මල් පිපෙයි දෙනෙත් ඇරෙයි ,මුළු ගතම වෙහෙසුනා, දස බලධාරී බුදුරජු පෙරකල

(2) බැස සීතල ගඟුලේ, සුදු සඳ එළියේ ,කඳුලු හෙලා නැඹිලියට

(3) මව්පියො ආදී ,රස ආහර කවලා , රුක් අත්තන මල මුදුනේ

(4) ජීවන මේ ගමන සංසාරේ , මංගෝ කළු නැන්දේ ,ඕලු නෙළුම් නෙරිය රඟාලා

- අංක 32 සිට 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ස්වර පුවරු රූප සටහන උපයෝගී කරගන්න.




32. ඉහත ස්වර පුවරු ආකෘතියේ අංක 6 8 10 11 13 15 17 සහ 18 යන ස්වර අයත් බටහිර ස්කේලය (Scale) වනුයේ,

(1) F Major ස්කේලයයි (2) C Major ස්කේලයයි

(3) G Major ස්කේලයයි (4) $B^b$ Major ස්කේලයයි

33. ඉහතින් දක්වා ඇති ස්වර පුවරු ආකෘතියේ 1, 4, 8 යන ස්වර තුන එකවර වාදනය කළ විට ලැබෙන බටහිර කෝඩ් (Chord) එක වනුයේ

(1) G Minor (2) C Minor (3) F Major (4) C Major

34. G Minor ස්කේලයට අයත් ස්වර වලට හිමි අංක නිවැරදිව ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) 8, 10, 12, 13, 15, 17, 19, 20, (2) 8, 10, 11, 13, 15, 17, 19, 24,

(3) 8, 10, 12, 14, 15, 17, 19, 20, (4) 8, 10, 11, 13, 15, 16, 18, 20,

35. මධ්‍ය සඩ්ජයේ සංඛ්‍යාතය 256 $H_z$ වන විට මධ්‍යමය සහ පංචමයේ සංඛ්‍යාත පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 320 $H_z$ සහ 426 $H_z$ (2) 340 $H_z$ සහ 384 $H_z$

(3) 288 $H_z$ සහ 340 $H_z$ (4) 320 $H_z$ සහ 480 $H_z$

36. හෙළ /ජා - ති ක /අ භි මා - / නේ - - - / - - වැ ඩු / මෙම ගීත පාදය ගැයීම ආරම්භ කරනුයේ,

(1) සමස්ථානයෙනි (2) සමග්‍රහයෙනි

(3) විෂමග්‍රහයෙනි (4) අවග්‍රහයෙනි

37. තත් වාද්‍ය සංගීත භාණ්ඩයක තතෙහි ඝණකම අඩුවීම තුළින් සිදුවන්නේ,

(1) කම්පන සංඛ්‍යාතය අඩුවීම සහ තාරතාවය පහළ යාම යි.

(2) කම්පන සංඛ්‍යාතය අඩුවීම සහ තාරතාවය ඉහළ යාම යි

(3) කම්පන සංඛ්‍යාතය වැඩිවීම සහ තාරතාවය පහළ යාම යි

(4) කම්පන සංඛ්‍යාතය වැඩි වීම සහ තාරතාවය ඉහළ යාම යි

38. මෝසාර්ට් සහ බීතෝවන් යන අපරදිග සංගීතඥයන්ගේ නිර්මාණ දෙකක් පිළිවෙලින් සඳහන් පිළිතුර කුමක් ද?

(1) ජුපිටර් 41 සහ ද මැජික් ෆ්ලූට් (2) 39 - $E^b$ Major සහ පැස්ටරෝල් 06

(3) 39 -$E^b$ Major සහ ජුපිටර් 41 (4) පැස්ටරෝල් 06 සහ කෝරල් 09

39. Multi Track Recording සඳහා භාවිත කළහැකි මෘදුකාංගය ( Software) කුමක් ද?

(1) Microsoft Office. (2) Adobe InDesign.

(3) Steinberg Cubase. (4) Adobe Photoshop.

40. පටිගත කරගත් සංගීත කෘති සංරක්ෂණය කළයුතු වේ. ඒවා ගබඩා කිරීමට භාවිත කළ හැකි මෙවලමක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ගුවන්විදුලි යන්ත්‍රය (Radio) (2) රූපවාහිනී යන්ත්‍රය (Television)

(3) CD ප්ලේයරය (CD Player) (4) දෘඩ තැටිය (Hard Disk)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

40/S/I,II

# පෙරහුරු පරීක්ෂණය - 2024

## 11 ශ්‍රේණිය

සංගීතය (පෙරදිග) I, II

## සංගීතය (පෙරදිග) II

- ❖ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ❖ සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

1. අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න

   (i) රි ගු රි ම ගු රිස, රි ප ම ප, ම ගු රි ස යන ස්වර සංගතිය අයත් වන රාගය නම් කරන්න.

   (ii) එක් ආවර්තයකට මාත්‍රා . දහයක් බැගින් යෙදෙන හින්දුස්ථානී තාලය නම් කරන්න.

   (iii) රි ග ම් ධ නි යන ස්වර පහම විවාදී ස්වර ලෙස යොදාගතහැකි රාගය කුමක් ද?

   (iv) ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා විසින් දේශීය ජන සංගීතය පිළිබඳව රචනා කළ ග්‍රන්ථය කුමක්ද

   අංක (v) සිට (viii) තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.

   - අපි කිරිල්ලියෝ සලන තටු නිබඳේ
   - කොහොව් යනා හඬ නගනා
   - මල් සරා බැල්ම හෙළා
   - කම්හලේ පියස යට
   - මනමත් කරවන දන මුළු දෙරනා

   (v) දේශීය ජන නාදමාලා ඇසුරු කර ගනිමින් නිර්මාණය වී ඇති සරල ගීතයේ ගීත පාදය තෝරා ලියන්න.

   (vi) සොළොස්මත් සේ ගීයකට අයත් ගීත පාදය තෝරා ලියන්න.

   (vii) ජප් තාලයට අනුව ගැයෙන ගී පාදය තෝරා ලියන්න.

   (viii) සබරගමු වන්නමකට අයත් ගී පාදය තෝරා ලියන්න.

   අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමගින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න

   (ix) සබරගමු වන්නම් කොටස්......................කින් සමන්විත වන අතර, පහතරට සින්දු වන්නම් කොටස්.......................කින් යුක්ත වේ.

   (x) සත් සමුදුර චිත්‍රපටයෙහි සංගීත අධ්‍යක්ෂණය...................................................මහතා විසින් සිදුකළ අතර, එම චිත්‍රපටයේ එන සුවිශේෂී ගීතයක් වන......................................................නම් ගීතය තුළ සංධ්වනියක ලක්ෂණ පෙන්නුම් කර ඇත.

02. (i) පහත A B C අක්ෂර යටතෙහි සඳහන් රාග සංගති වලින් පිළිබිඹුවන හින්දුස්ථානී රාග තුනෙහි නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියා දක්වන්න. (ලකුණු 03 යි)

A - රි නි ධ නි, ප ධ ම ප, ම ග රි ස

B - නි ධ, නි රි ග රි ග, ප රි ස

C - ග ප ධ ස්, ධ ප, ග ප ග රි ස

(ii) ඉහත ස්වර සංගතිවලින් පිළිබිඹුවන රාග තුනෙන් ඔබ කැමති රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ ලක්ෂණ ගීතයක හෝ ස්ථායි කොටසෙහි ගීත ස්වර ප්‍රස්තාරය ලියන්න.

**නැතහොත්,**

එම එක් රාගයකට අයත් මධ්‍යලය වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි)

(iii) හයවන මාත්‍රාව මත බලිය පිහිටන නිර්දේශිත හින්දුස්ථානී තාලය නම්කර, එම තාලයෙහි ඨේකාව නියමිත මාත්‍රා, විභාග, තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03 යි)

03. නිර්දේශිත රාග දෙකකට අයත් තොරතුරු පහතින් දක්වා ඇත.

- දිවා ප්‍රථම ප්‍රහරයේ ගැයීමට සුදුසු මෙම රාගයේ සියලු ම ස්වර ශුද්ධව යෙදේ .
- සර්ව කෝමළ රාගයක් ලෙස හඳුන්වන මෙම රාගයෙහි මධ්‍යමය සහ සඩ්ජය වාදී, සංවාදී ස්වර ලෙස යෙදේ.
- ගරි, ගප, මගමරිස මෙම රාගයේ යෙදෙන ස්වර සංගතියකි.
- සරිගුම ගුරිස ධුනි සරිස මෙම රාගයේ යෙදෙන ස්වර සංගතියකි.

(i) ඉහත තොරතුරුවලට අනුව අදාළ රාග දෙක නම්කර, එම තොරතුරු රාග දෙක යටතේ ලියා දක්වන්න. (ලකුණු 06 යි)

(ii) ඉහත එක් රාගයකට අයත් සර්ගම් ප්‍රබන්ධයක ස්ථායි සහ අන්තරා ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත ඔබ ප්‍රස්තාර කළ සර්ගම් ගීතයට ගැලපෙන හින්දුස්ථානි තාලය නම්කර, නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 02 යි)

04. (i) මහනුවර යුගයේදී ලාංකීය සංගීත ක්ෂේත්‍රයට එක්වූ ගීත වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සේ ගී වල විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(iii) ගැමි ගී නිර්මාණයට බලපෑ හේතු සාධක තුන නම්කර, එක් එක් හේතුව සඳහා උදාහරණ ගීත පාදය බැගින් ලියා දක්වන්න. (ලකුණු 06 යි)

(iv) නිර්දේශිත සබරගමු වන්නමක තානම සහ එක් කවියක් ලියා දක්වන්න. (ලකුණු 02 යි)

05. දේශීය රංග සම්ප්‍රදායයන් හතරකට අදාළ තොරතුරු පහතින් දැක්වේ.

A - ලංකාවේ දකුණු ප්‍රදේශයේ ප්‍රචලිතව පැවැති, පිරිමින් පමණක් රංගනයෙන් දායක වූ ජන නාට්‍ය විශේෂයකි.

B - බලිවාලා ප්‍රමුඛ පර්සියානු නාට්‍ය කණ්ඩායමේ ලංකාගමනයෙන් ආරම්භ වූ බව පැවසෙන රංග ශෛලියකි.

C - දොන් පිළිප්පු සිංඤෝ මහතා විසින් රචනා කළ ඇහැළේපොළ, රජතුන් කට්ටුව ආදී නාට්‍ය මෙම රංග ශෛලියට අයත් වේ.


D - කොළපත් වලින් තනාගත් වෙස්මුහුණු භාවිතකළ උඩරට ප්‍රදේශයේ ප්‍රචලිත වූ, ජන නාට්‍ය විශේෂයකි.


(i) ඉහත තොරතුරුවලට අදාළ රංග සම්ප්‍රදායයන් හතර අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(ii) A සහ C රංග ශෛලීන්ට ආවේනික සංගීතමය ලක්ෂණ දෙක බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(iii) B සහ D රංග සම්ප්‍රදායයන් දෙකින් එකකට අයත් ගීතයක මුල් පාද දෙකක් තාලානුකූලව පද ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04 යි)

06. පහත දැක්වෙනුයේ අපරදිග ස්වර ප්‍රස්තාරයක කොටසකි.







(i) ඉහත අපරදිග ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි)

(ii) එම ප්‍රස්තාරයේ පළමු විභාග හතර මධ්‍යමභාවයට පෙරලා පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (එක් විභාගයකට ලකුණු 1/2 බැගින් ලකුණු 02 යි)


(iii) පහත A, B, C සහ D යන ඉංග්‍රීසි අක්ෂරයන්ගෙන් දැක්වෙන අපරදිග සංගීත ප්‍රස්තාර සංකේතවල නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියන්න. ( ලකුණු 1/2 බැගින් සංකේත හතරට ලකුණු 02 යි)




A



B



C



C

07. පහත සඳහන් ප්‍රශ්න අතුරෙන් **තුනක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) "යානි "සංගීතඥයාගේ සංගීත නිර්මාණ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(ii) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත නිර්මාණකරුවන් ලෙස ආනන්ද සමරකෝන් මහතාගේ සහ සුනිල් ශාන්ත මහතාගේ ගීත නිර්මාණ දෙක බැගින් ලියන්න.

(iii) නව නාට්‍ය දෙකක් නම්කර එම නාට්‍ය දෙකෙහි එන ගීත දෙකක පලමු පාද ලියන්න.

(iv) පහතරට සින්දු වන්නම් පිළිබඳ කරුණු හතරක් ලියන්න.

(v) ඔබ කැමති ස්වර වාද්‍ය භාණ්ඩයක දළ රූපසටහනක් ඇඳ එහි ස, රි, ග, ම, යන ස්වර හතර පිහිටන ස්ථාන ලකුණු කරන්න.

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පෙරහුරු පරීක්ෂණය - 2024

## 11 ශ්‍රේණිය

**සංගීතය (පෙරදිග) - I කොටස** **පිළිතුරු පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **3** | 11 | **2** | 21 | **2** | 31 | **3** |
| 02 | **4** | 12 | **4** | 22 | **3** | 32 | **1** |
| 03 | **1** | 13 | **1** | 23 | **1** | 33 | **2** |
| 04 | **2** | 14 | **3** | 24 | **4** | 34 | **4** |
| 05 | **4** | 15 | **2** | 25 | **1** | 35 | **2** |
| 06 | **1** | 16 | **3** | 26 | **3** | 36 | **3** |
| 07 | **1** | 17 | **1** | 27 | **2** | 37 | **4** |
| 08 | **3** | 18 | **2** | 28 | **4** | 38 | **2** |
| 09 | **2** | 19 | **4** | 29 | **1** | 39 | **3** |
| 10 | **4** | 20 | **1** | 30 | **2** | 40 | **4** |

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පෙරහුරු පරීක්ෂණය - 2024

## 11 ශ්‍රේණිය

**සංගීතය (පෙරදිග) - II කොටස** **පිළිතුරු පත්‍රය**

**01** පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

අංක (i) සිට (viii) දක්වා ලකුණු 01 බැගින් ද (ix) හා (x) කොටස් වලට ලකුණු 02 බැගින් ද හිමි වේ.

I. කාෆි රාගය
II. ජප් තාලය
III. භෛරවී රාගය
IV. හෙළ ගී මඟ
V. මල්සරා බැල්ම හෙළා
VI. මනමත් කරවන දන මුළු දෙරනා
VII. කම්හලේ පියස යට
VIII. කොහොව් යනා හඬ නගනා
IX. 05 කින් / 04 කින්
X. සෝමදාස ඇල්විටිගල / සිනිඳු සුදුමුතු තලාවේ ගීතය

02.

(i) රාග තුනෙහි නම් ඉංග්‍රීසි අක්ෂරය සමග ලිවීමට 1 x 3 (ලකුණු 03 යි)

A - කාෆි රාගය

B - යමන් රාගය

C - භූපාලි රාගය

(ii) ඉහත එක් රාගයකට අදාලව ස්ථායි කොටසෙහි ගීත ස්වර ප්‍රස්ථාරය නිවැරදිව ප්‍රස්ථාර කිරීමට

නැතහොත්

වාදිතයක ස්ථායි කොටස ප්‍රස්ථාර කර තානාලංකාර දෙකක් නිවැරදිව ප්‍රස්ථාර කිරීමට (ලකුණු 06 යි)

(iii) ජප් තාලය ලෙස නම් කර නිවැරදිව තාල සංඥා සහිතව ප්‍රස්ථාර කිරීමට (ලකුණු 03 යි)

03. (i) රාග දෙක නම් කිරීමට (ලකුණු 02 යි)
රාග දෙක යටතේ නිවැරදිව කරුණු වෙන්කර දැක්වීමට (ලකුණු 04 යි)

| බිලාවල් රාගය | භෛරවී රාගය |
|---|---|
| දිවා ප්‍රථම ප්‍රහරයේ ගැයීමට සුදුසු මෙම රාගයේ සියලුම ස්වර ශුද්ධව යෙදේ. | සර්ව කෝමල රාගයක් ලෙස හඳුන්වන මෙම රාගයෙහි ම, ස ස්වර වාදී සහ සංවාදී ස්වර ලෙස යෙදේ |
| ගරි, ගප, මගමරිස මෙම රාගයේ යෙදෙන ස්වර සංගතියකි. | ස<u>රි</u>ගුම <u>ගු</u><u>රි</u>ස <u>ධූ</u><u>නි</u> ස<u>රි</u>ස මෙම රාගයේ යෙදෙන ස්වර සංගතියකි |

(ii) ඉහත එක් රාගයකට අයත් සර්ගම් ගීතයන ස්ථායි අන්තරා නිවැරදිව ප්‍රස්ථාර කිරීමට (ලකුණු 04)

(iii) ඉහත සර්ගම් ගීතයට අනුව ගැලපෙන හින්දුස්ථානි තාලය නිවැරදිව ප්‍රස්ථාර කර ඇත්නම් (ලකුණු02)

04.

(i) වන්නම්, ප්‍රශස්ති ,හටන් ආදී ලෙස ගීත වර්ග දෙකක් නම් කිරීමට (ලකුණු 02 යි)

(ii) උගතුන් විසින් රචනා කර තිබීම

වියත් බසින් රචනා වීම

රචකයා නිර්නාමික වීම

පොත්පත්වල ලියා පැවතීම

උපමා උපමේය, කාව්‍යාලංකාර ආදිය සහිතව නිර්මාණය වීම

ආදී කරුණු අතරින් 02 ක් ලිවීමට (ලකුණු 02 යි)

(iii) ගැමි ගී නිර්මාණයට බලපෑ හේතු තුන ලිවීමට (ලකුණු 03 යි)

ගී විශේෂ යටතේ අදාළ ගීත පාද තුනක් ලිවීමට (ලකුණු 03 යි)

| ගැමි ගී නිර්මාණයට බලපෑ හේතු | උදාහරණ ගීත පාද |
|---|---|
| වෘත්තීන් මත පදනම්ව | ගී විශේෂ යටතේ අදාළ ගීත පාද තුනක් ලියා තිබීම ප්‍රමාණවත්ය |
| ඇදහිලි හා විශ්වාස මත | |
| විනෝදාස්වාදය හා සමාජීය අවශ්‍යතා මත | |

(iv) නිර්දේශිත සබරගමු වන්නමක් නම් කර තානම සහ එක් කවියක් ලියා ඇත්නම් (ලකුණු 02 යි)

05.

(i) A - කෝලම්
B - නූර්ති
C - නාඩගම්
D - සොකරි (ලකුණු 04 යි)

(ii) කෝලම් සහ නාඩගම් රංග ශෛලීන් හි සංගීතමය ලක්ෂණ 02 බැගින් ලිවීමට (ලකුණු 04 යි)

(iii) නූර්ති හෝ සොකරි නාට්‍ය ගීතයක මුල් පාද දෙකක් තාලානුකූලව පද ප්‍රස්තාර කර ඇත්නම් (ලකුණු 04 යි)

06.

(i) | + + ස නි̣ | ස ගග ම ප | – ධ නි – | සං නිනි පප මම |

| ධ – – ප | + ම ග රි | + ග ස රි | ස – – – | විභාග අටට (ලකුණු 08 යි)

(ii) | + + ම ග | ම ධධ <u>නි</u> සං | – රිං ගං – | මං ගංගං සංසං <u>නිනි</u> | එක් විභාගයකට ලකුණු 1/2 බැගින් 02 යි)

(iii) A - ට්‍රෙබල් ක්ලෙෆ් (Treble Clef) B - ක්‍රොචට් රෙස්ට් (Crotchet Rest)

C - ඩොටඩ් මිනිම් (Dotted Minim) D - ෂාර්ප් (Sharp) (ලකුණු 1/2 බැගින් 02 යි)

07. එක් කොටසක් සඳහා ලකුණු 04 බැගින් කොටස් 03 ට ලකුණු 12 ක් හිමිවේ

(ලකුණු 04 x 03 = 12 යි )